# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1656/6 – 2010 මැයි 31 වැනි සඳුදා – 2010.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 80/34

### පඩිපාලක සභා ආඥා පනත

පඩිපාලක සභා ආඥා පනතේ (136 පරිච්ඡේදයේ) 20 (2) ඩී යන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් වර්ෂ 1944 නොවැම්බර් මස 03 වැනි දින අංක 9,327, වර්ෂ 1949 අප්‍රේල් මස 01 වැනි දින අංක 9,963, වර්ෂ 1953 ජුනි මස 25 වැනි දින අංක 10,541, වර්ෂ 1958 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 11,568, වර්ෂ 1962 ජුනි මස 22 වැනි දින අංක 13,179 යන *ගැසට් පත්‍රයන්හි* පළ කරන ලද නිවේදන මාර්ගයෙන් නියම බලධාරියා ලෙස පත් කරනු ලැබූ ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තැන්පත්, දිමිංගු බඩතුරුගේ ප්‍රියන්ති සුරංජනා විද්‍යාරත්න වන මම, මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් එක් එක් ව්‍යාපාරයන්හි නියුක්ත සේවකයන් කෙරෙහි වර්ෂ 2010 මැයි මාසය තුළ අදාළ කළ හැකි ජීවන වියදම් දර්ශකාංකය (2002 පදනම් වූ) 215.9 වන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ඩී. බී. පී. සුරංජනා විද්‍යාරත්න,  
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්.

2010 මැයි මස 31 වැනි දින,  
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,  
තැ.පෙ. 563,  
කොළඹ 07.

උපලේඛනය

(1) කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ සැදීමේ ව්‍යාපාරය.

06 – 629/1


1A – G 12964 – 340 (2010/05)

**කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීම සහ සැදීම යන කර්මාන්තවල නියුතු සේවකයන්ට ගෙවිය යුතු විශේෂ දීමනා**

ඉහත සඳහන් කර්මාන්තය සඳහා 2010 මැයි මාසයේ ජීවන වියදම් අංකය 215.9 වන නිසා 2010 ජූනි මාසයේ සාමාන්‍ය වැඩකරන දිනයක්, මාසයක් වෙනුවෙන් ගෙවිය යුතු විශේෂ දීමනා පහත දැක්වෙන ආකාරයට බැවි පඩිපාලක සභා ආඥා පනතේ (136 වැනි අධිකාරය) 20 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීම සහ සැදීම යන කර්මාන්තයන් –**

| *සේවා පන්තිය* | *සාමාන්‍ය වැඩකරන දිනකට/මසකට ලැබිය යුතු විශේෂ දීමනා රු. ශත* |
|---|---|
| *දෛනික වැටුප් ලබන්නෝ* | |
| කම්කරුවෙකුට - පිරිමි/ගැහැණු | 311.00 |
| මාසික වැටුප් ලබන්නෝ | 13,689.65 |

**වී. බී. පී. කේ. වීරසිංහ,**
වැඩබලන කම්කරු කොමසාරිස් ජනරාල්.

2010 මැයි මස 31 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

06 – 629/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.